**ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම -2022/ 2023**

**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයන් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයන් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී විශ්‍රාම පාරිතෝෂික සඳහා රු. 1,514,896 ක මුදලක් වෙන්කර තිබුණ ද ඒ සඳහා අවශ්‍ය උපලේඛන ඉදිරිපත් කර නොතිබුණු අතර එම නිසා එම වටිනාකමේ නිවැරදිතාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය. | සේවකයින් සඳහා අර්ථසාධක මුදල් සහ පාරිතෝෂික වෙන් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. මේ පිළිබඳව 2023.09.11 දින පැවති විගණන කමිටු රැස්වීමේ දී ද සාකච්ඡා කරන ලද අතර ඒ පිළිබඳව නීතිමය කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | පාරිතෝෂික වෙන් කිරීම් පිළිබඳ උපලේඛන විගණනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ආයෝජනය රු.83,431,594 ක් වූ අතර බැංකුව විසින් එවා ඇති තහවුරු කිරීම් සමඟ සැසඳු විට රු. 13,498,955 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ආයෝජන සම්බන්ධව උපලේඛන බැංකු තහවුරු කිරීම් සමග ලබාගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතින අතර රුපියල් 13,498,955 ක වෙනස සඳහා අවශ්‍ය ජර්නල් සටහන් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පතු ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු සත්‍ය ශේෂය ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ජර්නල් සටහන් 37 ක් මඟින් ගිණුම් අතර මාරු කිරීම් කර තිබූ රු.93,442,034 ක සටහන් වලට අදාළ මූලාශ්‍ර ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවූයෙන් අදාළ ජ'නල් සටහන් වල නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2023.08.31 පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර එම උපලේඛන ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | විගණනය සඳහා අදාළ ජර්නල් සටහන් හා ජර්නල් වවුචර ඉදිරිපත් කළ යුතු වේ. |
| (ඈ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.626,473 ක් වටිනා අක්කර 58 ක ඉඩමක් අන්තර්ගත වුවත් ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය හෝ භුක්තිය සමාගම සතුව නොතිබුණි. | මෙම ඉඩමේ ඔප්පුව දැනට ඉන්දීය අශෝක් ලේලන්ඩ් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා සතුව ඇත. මෙම ඉඩම ලංකා ලේලන්ඩ් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගම වෙත පවරා ඇත. | අදාළ ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය සහ භුක්තිය සමාගමට ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වාහන කුලිය හා අළුත්වැඩියා වියදම | 1,437,500 | කුලී ගිවිසුම | 2023.08.31 පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර එය ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | අදාළ කුලී ගිවිසුම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| ගොඩනැගිලි කුලිය | 120,000 | කුලී ගිවිසුම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය | මෙම කුලී ගිවිසුම ලබාගැනීම සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරමින් පවතී. | විධිමත් කුලී ගිවිසුමක් අදාළ වියදම සඳහා ලබා ගෙන විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛය 2.3 වගන්තිය | සමාගමේ සංයුක්ත සැලැස්ම එහි ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය සමඟ ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණ ද මෙම සමාගම සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය පිළියෙල කර නොතිබුණි. | මෙම ආයතනය වර්ෂ ගණනාවක කාලය තුල කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු කර නොමැත. මේ වන විට සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කරමින් පවතින අතර එම සැලසුම් සකස් කර අවසන් වූ වහාම ඒවා අමාත්‍යාශය වෙත සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛය 6.6 වගන්තිය | චක්‍රලේඛය පරිදි මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 153 ක ප්‍රමාදයකින් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | මෙම මූල්‍ය වාර්තා හිටපු සමාගම් ලේකම්වරයා යටතේ සිටි ගණකාධිකාරිවරයා විසින් පිළියෙල කර ඇත. එම වාර්තා පරික්ෂා කර ඉදිරිපත් කිරීමට නව පාලනාධිකාරියට යම් කාලයක් ගත විය. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 55,368,643 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 61,022,721 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,654,078 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

- ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ආශ්‍රිත සමාගම්වල ආයෝජන වටිනාකම සාපේක්ෂව රු.74,868,750 කින් එනම්, සියයට 06 කින් අඩු වී තිබුණි.

- සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන පොලී ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සාපේක්ෂව රු. 10,157,927 කින් එනම්, සියයට 233 කින් වැඩි වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාගමේ ජංගම වත්කම් අනුපාතය යහපත් තත්වයක් නිරූපණය කෙරිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 ජූලි 14 දින පිහිටුවා තිබූ සමාගම මේ දක්වා කිසිදු මෙහෙයුම් කටයුත්තක් ආරම්භ කර නොතිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී රු.6,140,107 ක පරිපාලන වියදම් දරා තිබුණු අතර ඉන් රු.3,690,227 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල වියදම් ලෙස දරා තිබුණි. | මෙම සමාගම මේ කාලය තුළ දී කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදුකර නොමැත. ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගමෙන් සියයට 41.77 ක කොටස් හිමිකමක් සමාගම සතුව ඇත. නමුත් වැඩි කොටස් හිමි සමාගම ලෙස ගිවිසුමේ අනෙක් පාර්ශ්වය වූ ඉන්දීය අශෝක් ලේලන්ඩ් සමාගම සමග එක්ව මෙහෙයුම් කටයුත්තක් ආරම්භ කිරීමට හෝ එම සමාගමේ කටයුතු නියාමනය කිරීම සඳහා ලංකා ලේලන්ඩ් සමාගමේ මීට ඉහත දී සේවය කළ පාලනාධිකාරිය කටයුතු කර නොමැත. මෙම පරිපාලන වියදමෙන් සියයට 60ක ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩල වියදම් ගාස්තු සහ ප්‍රවාහන වියදම් සඳහා ගෙවා තිබුණි. මෙම වියදම් දරා තිබුණ ද වසර 10 කට වැඩි කාලයක් තිස්සේ කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදුකර නොමැත. | සමාගම සඳහා උපාය මාර්ගික සැලැස්මක් මෙන්ම වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර සාංගමික ව්‍යවස්ථාවලියට අනුව ඉදිරි මෙහෙයුම් කටයුතු සිදු කළ යුතුවේ. |